The Journal of Studies in Humanities

Volume 5 (II) 2019

Department of Humanities, Rajarata University of Sri Lanka

# බුදුසමය මගින් නිර්දේශිත පැවිද්ද හා බෞද්ධ පැවිද්දෙහි සුවිශේෂත්වය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්

**හල්පිටියේ සමිතසිරි හිමි**

භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.

Email: hsamithasiri@busl.ac.lk

## Abstract

The historical and literary sources reveal that the origin of the Buddhist order dates back to pre-Buddhist history. The advent of Buddhism emerges within the scope of sixty-two misconceptions. In this context, there were two main religious traditions: Shramana, Brahmana, and the religious sects opposed to Brahmana sect held the views of Shramana. The Sangha order descended from Arahant Anńna Kondanna Maha thera belongs to the Shramana sect and the common characteristics depicted in the Shramana tradition were also reflected in the Sangha society. But out of the rest of Shramana traditions, there emerged an exceptional Sangha tradition. Accordingly, it is expected to inquire about the monkhood of Buddhism and the special features of monkhood in Buddhism in this study.

**Key words:** Buddhism, Sangha, monkhood in Buddhism, historical literetures, religious traditions.

## හැඳින්වීම

ශ්‍රමණ සම්ප්‍රදායෙහි ආරම්භය ප්‍රාග් බෞද්ධ ඉතිහාසයෙහි ඉතා ඈතට දිවයන්නක් බව ඓතිහාසික හා සාහිත්‍යාගත තොරතුරුවලින් ප්‍රකට වේ. බුදුසමයේ උදාව සිදුවනුයේ දෙසැටක් මිත්‍යාදෘෂ්ටීන්ගෙන් ගහණ වූ සාමයික පසුබිමක් තුළ ය. එවකට ''ශ්‍රමණ හා බ්‍රාහ්මණ'' යනුවෙන් ප්‍රධාන ආගමික සම්ප්‍රදාය දෙකක් පැවති අතර බ්‍රාහ්මණ ආගමික සම්ප්‍රදායට විරුද්ධ වූ ආගමික සම්ප්‍රදාය සියල්ල පොදුවේ ශ්‍රමණ සම්ප්‍රදායට අයත් විය. අඤ්ඤා කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේගෙන් ඇරඹි සඟසසුන ද ශ්‍රමණ සම්ප්‍රදායට ම අයත් වූවක් විය. ශ්‍රමණ සම්ප්‍රදාය කෙරෙන් විද්‍යමාන වූ පොදු ආකෘතිකමය ලක්ෂණ රාශියක් දැකගත හැකි අතර භික්ෂු සමාජය තුළ ද ඒවා විද්‍යමාන විය. එහෙත් සෙසු ශ්‍රමණ සම්ප්‍රදායන් අතුරෙන් භික්ෂූන් වහන්සේලා සුවිශේෂි සංස්ථාවක් ලෙසත් ආරම්භයේ පටන් ම ක්‍රියාත්මක වූහ.

## අරමුණ හා ක්‍රමවේදය

ඒ අනුව මෙහිදී බුදුසමය මගින් නිර්දේශිත පැවිද්දත් බෞද්ධ පැවිද්දෙහි සුවිශේෂත්වය පිළිබඳවත් විමසා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අපේක්ෂාව වේ. ත්‍රිපිටකය ඇතුලු බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද පසුකාලීන ව ලියැවුණු ද්විතියික මූලාශ්‍රයයත් යොදාගනිමින් ද දත්ත එක්රැස් කළ අතර අන්තර්ගතය විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ තොරතුරු විශ්ලේෂනය කෙරිණි.

## සාකච්ඡාව

### ප්‍රාග් බෞද්ධ පබ්බජ්ජාව

පබ්බජ්ජාව නොහොත් පැවිද්ද වනාහි භාරතයට ආර්යයන් පැමිණීමට පෙර පටන් ම පැවති බව මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාරවලින් මතුකරගන්නා ලද පුරාවිද්‍යා ස්මාරක තුළින් හෙළිවේ. (බෂාම් 1995: 24). මෙය භාරතයේ පූජ්‍යයන් පිළිබඳව ආදිත ම ආදර්ශය ලෙස විචාරකයෝ කල්පනා කරති. ඍග්වේදයේ යතිවරුන් පිළිබඳ සඳහන් වී ඇත්තේ මුනි නාමයෙනි. ඊට අමතරව කේශී හා ව්‍රාත්‍ය නම් පැවිදි පිරිසක් පිළිබඳව සඳහන් වේ.

ත්‍රිපිටකාගත කරුණු විමසා බලන කල්හි ද බුදුසමයට පූර්වයෙන් භාරතයේ පැවිදි සම්ප්‍රදායයන් පැවති බව පැහැදිලිය. පෙළ දහම තුළ බොහෝ තැන්වල හමුවන ''ශ්‍රමණ-බ්‍රාහ්මණ'' (දීඝ නිකාය, බ්‍රහ්මජාල සූත්‍රය 2005: 22)[1] යන වචන ද්වයෙන් අදහස් කොට ඇත්තේ ප්‍රාග් බෞද්ධ ආගමික සම්ප්‍රදාය ද්වය ඔස්සේ විකාශනය වී පැමිණ ආගමික ජීවිතයක් ගතකළවුන් බව පෙනේ. එහිදි ශ්‍රමණ සම්ප්‍රදාය වේද ඉගැන්වීම් හා බ්‍රාහ්මණවාදය ප්‍රතික්ෂේප කරමින් මොහෙන්ජොදාරෝ හරප්පා යුගයේ සිට පැවත ආවා වූ ක්‍රමවේදය අනුගමනය කරමින් මානසික සංවර්ධනයක් ඇතිකරගන්නට වෙර දැරූ පිරිසක් ලෙසින් ද බ්‍රාහ්මණයන් වනාහි වේදය ගුරුකොට ගෙන පැමිණි පිරිස ලෙසින් ද හඳුනාගත හැකි ය.

යෝග භාවනා මගින් ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇතිකර ගැනීමට පැවිදි සම්ප්‍රදාය යොමු වී ඇත. ඒ තුළින් ගොඩනගාගන්නා ලද චිත්ත සංවර්ධනය ඔස්සේ දාර්ශනික සංකල්පයන් සමාජගත කරන්නට ඔවුන් කටයුතු කොට තිබේ. දාර්ශනික වශයෙන් උසස් ශ්‍රමණ, මුනි, පරිබ්‍රාජක, ආජීවක, ජටිල, නිගණ්ඨ (සංයුක්ත නිකාය, කෝසල සංයුක්තය, සත්ත ජටිල සූත්‍රය 2005: 146) වැනි නම්වලින් හැඳින්වුණු පැවිද්දන් අනගාරික සංචාරක ජීවිත ගතකළ බව පෙනේ. හුදකලාව වාසය කරමින්, එළිමහන්, රුක්මුල්, කූටාගාරසාලා, සන්ථාගාරසාලා වැනි පෞද්ගලික නොවන ස්ථානවල ලැගුම් ගනිමින් තමාගේ ආධ්‍යාත්මික අවබෝධය මහජනතාවට දේශනා කරමින් ක්‍රියාකළ ආධ්‍යාත්ම විද්‍යාවෙන් දියුණු පැවිදි පිරිස් බෞද්ධ භාරතයේ බිහි වූ බව පැවසිය හැකි ය.

ප්‍රව්‍රජ්‍යා යන පදය සැකසී ඇත්තේ උතුම් වූ ඉදිරි ගමන් ඇති යන අදහසිනි. එය ප්‍ර පූර්ව √ව්‍රජ් ධාතුවෙන් සිද්ධ ය. එමෙන්ම 'ප්‍ර' යන්නෙන් ''ප්‍රකෘෂ්ට, උතුම්, ශ්‍රේෂ්ඨ, අපහසු, දුෂ්කර, ගැඹුරු ගමන'' යනාදි අදහස් ප්‍රකාශ කෙරේ. (අගාරස්මා අනගාරියං පබ්බජති) (දීඝ නිකාය, සාමඤ්ඤඵල සූත්‍රය 2005: 110). ප්‍රව්‍රජ්‍යා සංකල්පය ආධ්‍යාත්මික කාර්යයක් ම

අදහස් කොටගෙන ඉදිරිපත් වී ඇති බව වටහාගත හැකි ය. එසේ ආධ්‍යාත්මික විමුක්තියක් සොයා අගාරික ජීවිතයෙන් වෙන්ව සම්ප්‍රදාය වශයෙන් හා දාර්ශනික සංකල්පීය වශයෙන් වෙනස් වන්නා වූ විවිධ සම්ප්‍රදායයන් නියෝජනය කළා වූ පොදුවේ ශ්‍රමණ සම්ප්‍රදායට අයත් වූවා වූ පැවිදි කණ්ඩායම්වල දැකිය හැකි පොදු ලක්‍ෂණ කිහිපයකි.

- සියලුම ශ්‍රමණ සංඝයන් කිසියම් ආගමික චින්තන සම්ප්‍රදායක් දරන්නවුන් වශයෙන් සැලකේ.
- මොවුන් සියලු දෙනාම අනගාරික ය.
- සංචාරක ජීවිතයක් ගත කළ පිරිසකි.
- මේ ශ්‍රමණ සමාජවල බාහිර සමාජය සමග ඥාති මිත්‍ර සබඳතා නොවීය.
- නිත්‍ය වාසස්ථාන නොමැත.
- භික්‍ෂාටනයෙන් ප්‍රත්‍ය සලසා ගනී.
- වර්ෂා ඍතුවේ දී පමණක් එක් තැනක වාසය කරති.
- තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ තැනින් තැන යමින් සිය ධර්මය ප්‍රකශ කරති.
- ඊශ්වර නිර්මාණවාදය මුලුමනින්ම බැහැර කරති.
- යාගය, යාඥාව, වර්ණධර්ම, වර්ණාශ්‍රම ධර්ම, ස්වධර්මය බැහැර කරති.
- ශ්‍රැතමය ඥාණයට වඩා භාවනාමය ප්‍රඥාව අගය කරති. (අරියවිමල හිමි 1996: 133)
- ආධ්‍යාත්මික පාරිශුද්ධිය ලැබීමෙන් පූජාර්හ වීම අනුන්ගෙන් වැඳුම් පිදුම් ලැබීමට සුදුස්සන් වීම ශ්‍රමණ සංස්කෘතියේ අංගයක් විය.
- මිනිසා තුළ ස්වාමිත්වය සහ අදීනත්වය පිළිබඳ හැඟිම් පහළ කිරීමට අනුබල දීම.
- ශීල චර්යාව හා භාවනාව ශ්‍රමණ සංස්කෘතියේ උතුම් අංග වීම.
- කුලගර්වය බැහැර කොට මනුෂ්‍යාත්මභාවයට සැලකිල්ලක් දැක්වීම (රාහුල හිමි 1998:210-211)

මෙබඳු සමාන ලක්‍ෂණ රාශියක් ශ්‍රමණ සම්ප්‍රදායන් අතර දැකිය හැකි ය. බුද්ධකාලය වන විට මොවුන් පඤ්ච අභිඥා හා අෂ්ට සමාපත්ති උපදවා ගැනීම දක්වා චිත්ත පාරිශුද්ධිය ඇතිකරගෙන සිටි පිරිසක් වන බව පෙනේ. එහෙත් බුදු දහමට අනන්‍ය වූ ආසවක්ඛය ඥාණය හා සඤ්ඤාවේදයික නිරෝධය පිළිබඳ අවබෝධයක් මොවුන්ට නොපැවතුණි. එනිසා ඔවුන් තුළ පැවති ආධ්‍යාත්මික ඥාණය සම්පූර්ණ ඥාණයක් නොවූ බව පැහැදිලි ය. ඒ කෙසේ වෙතත් ප්‍රාග් බෞද්ධ පැවිදි සම්ප්‍රදායේ පැවති ආධ්‍යාත්මික විද්‍යාව පිළිබඳ උද්‍යෝගය පැසසිය යුතු ය. ඒ උද්‍යෝගය නිසාම බුදුසමයේ පහළ වීමට අවශ්‍ය චින්තන පසුතලය සැකසී තිබුණ බව කිව හැකි ය.

**බුදුසමය මගින් නිර්දේශිත පබ්බජ්ජාව**

පැවිද්ද හා උපසම්පදාව යනුවෙන් හඳුන්වනු ලබන සුවිශේෂි අවස්ථා දෙකක් බෞද්ධ අනගාරික ප්‍රතිපදාවෙහි ඇතුළත් වේ. පබ්බජ්ජා (ප+√වජ (ගතියං) + ආ) යන පාලි වචනයෙන් බිඳී ඇති පැවිද්ද යන වචනයෙන් ඇවිදීම හෝ කියවීම යන අරුත් ගෙන දේ. ලෞකිකත්වයෙන් මිදීම පිණිස පිටත්වීම (leaving the world) තපස හෝ පැවිදි ජීවිතය තෝරාගැනීම (adopting the ascetic life) භික්ෂුවක් වීමට අවශ්‍ය නීතිරීති භාර ගැනීම (the act of the priest conferring ordes) වැනි පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයේ සඳහන්ව තිබේ. (Davids and William 2004: 414). පබ්බජ්ජා යන පදය ප්‍රාග් බෞද්ධ අනගාරික සම්ප්‍රදායයන්ට අයත් ප්‍රව්‍රජ්‍යා යන්නෙහි පාලි ස්වරූපය වුව ද සංකල්පමය වශයෙන් මදක් වෙනස්කම් ඇති වචනයකි. බෞද්ධ අර්ථකථනයට අනුව ගිහි ජීවිතයෙන් මිදී පැමිණ ඇති ස්ථානය පැවිද්ද ය. අනගාරික ජීවිතයට පත්ව භික්ෂූත්වය අපේක්ෂාවෙන් පසුවන අවධිය මෙයින් අදහස් කෙරේ. මෙම ස්වරූපය ''සමණුද්දේස පැවිද්ද'' වශයෙන් ද හඳුන්වයි. එහෙයින් යමෙකු බෞද්ධ භික්ෂුවක වීමට අපේක්ෂා කරන්නේ නම් පළමුව සාමණේර පැවිද්ද ලැබිය යුතු ය.

උපසම්පදාව යනු සාමණේර පැවිද්ද ලැබීමෙන් අනතුරුව තවදුරටත් උසස් ශීල ප්‍රතිපදාවකට පත්වීමෙන් ලබන තත්ත්වයකි. එනිසා පැවිද්ද නැති තැන උපසම්පදාව නොමැත. පැවිද්දටම උපසම්පදාව අයත් ය. උප+සං+පද ධාතු මූලයෙන් නිපන් උපසම්පදා යන වචනයේ අදහස ''නිසි තැනට මනාව පත්වීම'' යන්නයි.

එම නිසි තැන වඩවඩාත් කුසල් රැස් කිරීමට ලද අවස්ථාව ශීලයෙහි උපරිම ශීලය යැයි කියන ලද අධිශීලයට පැමිණීම හෝ එය ලැබීම උපසම්පදාව නමැයි සිංහල විශ්වකෝෂයෙහි සඳහන් වේ. එහි සඳහන් සෙසු අර්ථකථන දෙක මදක් වෙනස් ස්වරූපයක් ගනී. ප්‍රධාන සම්පත්තිය නම් ධ්‍යානාදිය වන හෙයින් උපසම්පත්ති වශයෙන් අධිශීලය ගත හැකිය යන අදහසත්, විනයෙහි එන පරිදි දෝෂ විරහිත පැවිදි කෙනෙකු යථෝක්ත ශීලයට සුදුසු කෙනෙක් යැයි උපරිභාවය සඳහා සංඝයා කළ සම්මතයෙන් උපසම්පන්න වන බවක් එහි සඳහන් සෙසු අර්ථ දෙක වේ. මේ පිළිබඳ අදහස් දක්වන පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂය ''ලබා ගැනීම, අත්පත් කර ගැනීම, තමා විසින්ම ලබා ගැනීම (taking, acquiring, obtaining, taking Upon one self) (Davids and William 2004: 147). වැනි අර්ථ ඉදිරිපත් කරයි. Frankling Edgerton විසින් සංස්කරණය කරන ලද බෞද්ධ මිශ්‍ර සංස්කෘත ව්‍යාකරණ හා ශබ්දකෝෂයෙහි (Buddhist Hybrid Sanskrit Grammar and Dictionry) ක්‍රමික ස්ථර (Regular) විශ්ව ව්‍යාප්ත (Perhaps Universal) සත්‍ය වූ ඒකාන්ත පැවිදි බව පවත්වා ගෙන යන ක්‍රියා පිළිවෙළ (Regular Used when the actual ordination ceremony is in mind) යනාදි අර්ථකථන ඉදිරිපත් කර තිබේ. (Frankling 1993: 143).

මෙම සංකල්පය පාලි අට්ඨකතාකරුවන් විසින් විවිධ අයුරින් පැහැදිලි කරදීමට ගත් උත්සාහය අටුවා සාහිත්‍යයෙහි දක්නට ලැබේ. ඒ අනුව කුසලයන්ගේ නිපදවීම (උපසම්පදාති නිප්ඵාදනතා) (පටිසම්භිදාමග්ගට්ඨකතා 1965: 468). තම සන්තානයෙහි කුසල් උපදවා ගැනීම (උපදසම්පදායාති සම්පාදනාය. අත්තනො සන්තානෙ සම්පාදනාය) (පරමත්ථදීපනී නාම උදානට්ඨ කථා 1929: 156) ප්‍රතිලාභයක් උපදවා ගැනීම (උපසම්පත්ති පටිලාභා) ගිහි

හෙයින් නික්මීමේ පටන් අරහත් මාර්ගය කුසලයන්ගේ නිපදවීම අභිනික්ඛමන්තො පට්ඨාය අරහත්තමග්ගකුසලස්ස උප්පාදඤ්චෙව උප්පාදිතස්ස ච භාවනා) (ධම්මපදට්ඨ කථා 1908: 463) යනාදි අදහස් ඉදිරිපත් කොට තිබේ. බුදුදහමෙහි පැවිද්ද සැබවින්ම අර්ථවත් වී ඇත්තේ ආත්ම විමුක්තිය උදාකරගැනීම මත ය. අන්‍ය ශ්‍රමණ සම්ප්‍රදායන් ඉක්මවා ගිය සුවිශේෂී බවක් බුදුසමය තුළ දක්නට ලැබෙයි. බුදුන් වහන්සේ චූලසීහනාද සූත්‍රයේදී භික්ෂූන් අමතා දේශනා කරන ලද්දේ පළමු ශ්‍රමණයා ද, දෙවන ශ්‍රමණයා ද, තෙවන ශ්‍රමණයා ද, සිව්වන ශ්‍රමණයා ද මේ සස්නෙහි වන බවත් අන්‍ය පරවාදයන් ශ්‍රමණත්වයෙන් ශූන්‍ය වන බවත් පවසමින් මැනවින් සිංහනාද කරන ලෙසයි. (මජ්ඣිම නිකාය, චූලසීහනාද සූත්‍රය 2005: 154) එයින් බුදුසමය තුළ පැවිද්ද අර්ථවත් වී ඇත්තේ කවර පදනමක සිට දැයි පැහැදිලි වේ.

**බෞද්ධ පැවිද්ද හා එහි සුවිශේෂත්වය**

බුදුසමයට අයත් ප්‍රව්‍රජ්‍යාව පුද්ගල ජීවිතයට සම්බන්ධ වන්නේ ධර්මය පිළිබඳ අවබෝධය තුළින් ශාස්තෘ ප්‍රසාදය ජනිත වීමෙනි. එසේ ශ්‍රද්ධා ප්‍රතිලාභයට පැමිණි පුද්ගලයා ගෘහවාසය කෙලෙස් දූවිල්ලෙන් ගැවසීගත් මගක් ලෙස සලකා එහි සිට පිරිසිදු බඹසර විසිය නොහැකි බව සලකා කෙස් රැවුළු බහා කසාවත් හැඳ ප්‍රව්‍රජ්‍යාවට පත්විය යුතු යැයි කල්පනා කරයි. එසේ සිතන පුද්ගලයා අල්ප වූ ද මහත් වූ ද භෝග සම්පත් හැරපියා අල්ප වූ ද මහත් වූ ද නෑ පිරිවර හැරපියා අනගාරික ප්‍රව්‍රජ්‍යාවට පැමිණෙයි. මෙසේ පැවිද්දට පැමිණ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් වාසය කරයි. ආචාර ගෝචර සම්පන්නව වාසය කරයි. අනුමාත්‍රවූ ද වරදෙහි භය දක්නා සුලු වෙයි. ශික්ෂා පදයන්හි සමාදන්ව හික්මෙයි. කුශල සහගත කායික, වාචසික හා මානසික ක්‍රියාවෙන් යුක්ත වෙයි. ඉන්ද්‍රිය සංවරයෙන් යුතුවෙයි. භෝජනයෙහි මාත්‍රඥ වෙයි. සතිසම්පජඤ්ඤයෙන් යුතුවෙයි. සන්තුෂ්ටියෙන් යුතුවෙයි. (දීඝ නිකාය, සාමඤ්ඤඵල සූත්‍රය 2005: 110). මේ බුදුන් වහන්සේ විසින් සාමඤ්ඤඵල සූත්‍රයේ දී බුදුසමයේ පබ්බජ්ජාව විස්තර කොට ඇති ආකාරයයි. ඒ තුළින් ආධ්‍යාත්මික ප්‍රතිලාභය මත බුදුසමයෙහි පැවිද්ද නිර්දේශ වී ඇති අයුරු වටහාගත හැකි ය.

බුදුදහම තුළ පැවිද්ද අර්ථවත් වනුයේ ම සංසාර විමුක්තිය පදනම් කොට ගෙන ය. ඒ සඳහා පාදක වනුයේ ජීවිතය හා ලෝකය පිළිබඳව පවත්නා වූ අවබෝධයයි. ඒ බව භික්ෂු ශාසනය ආරම්භය පිළිබඳ මහාවග්ගපාළියේ එන තොරතුරු විමසීමේදී අවබෝධ වේ. භික්ෂු ශාසනය විවර වී ඇත්තේ කවර ස්වරූපයේ පුද්ගලයන්ට දැයි පහත සඳහන නිදර්ශනයකි. ''ඉක්බිති ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ දක්නා ලද සිවුසස් දහම ඇත්තේ, දුරු කළ සැක ඇත්තේ, පහ වූ සැක ඇත්තේ, විශාරදභාවයට පැමිණියේ, ශාස්තෘශාසනයෙහි අන් කෙනෙකුගෙන් පිටිවහලක් නැත්තේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමි' යැයි භාග්‍යවතුන් වහන්සේට සැළ කළේය. (මහාවග්ග පාළි, මහාඛන්දකය 2005: 26)[2] මෙහි පැවිද්ද රිසි වූ කොණ්ඩඤ්ඤ හිමියන්ගේ ස්වරූපය කෙබඳු දැයි දැක්වේ. ඒ අනුව, උන්වහන්සේ දක්නා ලද ධර්ම ඇති, පැමිණි ධර්ම ඇති, දුරු කළ සැක ඇති, පහ වූ සැක ඇති, විශාරද භාවයට පැමිණි යනාදි වූ අවබෝධයෙන් යුක්ත වූ උත්තමයෙකි. මේ වනාහි බෞද්ධ පැවිද්දේ සුවිශේෂත්වයයි. එනම්; දක්නා ලද දහම් ඇති පුද්ගලයාට සංසාරික විමුක්තිය සලසා දෙන ශාසනයකි.

බෞද්ධ පැවිද්ද සමාකාලීන සාමයික පසුබිම තුළ කොතෙක් දුරට අර්ථවත් වූවක් ද යන්න හඳුනා ගැනීමට සංයුක්ත නිකායෙහි චිත්ත සංයුක්තයෙහි එන අචේල සූත්‍රය හොඳ නිදසුනකි. චිත්ත ගෘහපතියාගේ පැරණි මිතුරෙකු වූ අචේල කස්සප බොහෝ කාලයකට පසුව සිය ගම් පෙදෙසට පැමිණි කල්හි ඔහු හමුවීමට ගිය චිත්ත ගෘහපතියාගේ වසර තිහක් වූ පැවිදි දිවිය තුළ උපදවා ගත් ගුණ විශේෂ කවරේ දැයි විමසූ කල්හි අචේල කස්සපගේ පිළිතුර වූයේ තිස්වසක් වූ මාගේ පැවිදි දිවිය තුළ නග්න බවත්, මඩු බවත්, වැලි පිසීමට ගන්නා මොනර පිල්කලඹක් හැර ආර්ය බව ඇති කිරීමෙහි සමත් ඤාණදර්ශන විශේෂයක් හෝ කිසියම් පහසු විහරණයක් නැති බවයි. (සංයුක්ත නිකාය, අචේල සූත්‍රය 2005: 548).[3] අන්‍ය ශ්‍රමණ සම්ප්‍රදායන් අතර සඟසසුන සුවිශේෂී වීමේ නිර්ණායකය ගුණ මහත්වය පදනම් කොට ගෙනම සිදු වේ.

ශ්‍රමණ ජීවිතයක පරමාර්ථය ගුණාධිගමය පදනම් කොට ගෙන ඇත. අරියපරියේසන සූත්‍රයේ දැක්වෙන ආකාරයට බෝසතාණන් වහන්සේ ගෘහ ජීවිතය හැරගියේ ''කිං සච්චග වෙසි, කිං කුසල ගවේසි'' (මජ්ඣිම නිකාය, අරියපරියේසන සූත්‍රය 2005: 400) සඳහා ය. චිත්ත ගෘහපතියා සිය තිස්වසක් වූ උපාසක ජීවිතය තුළ උපදවා ගත් ගුණ විශේෂයන් පිළිබඳ කරුණු දැනගත් අචේල කස්සප තුළ ඇති වූයේ විශ්වයකි. ''යම් හෙයකින් සුදුවස්ත්‍ර හැඳගත් ගිහියෝ මිනිස් දහමින් වැඩි පහසු විහරණ වූ ආර්යභාවය කිරීමෙහි සමත් මෙබඳු ඥානදර්ශන විශේෂයක් ලැබුවාහු නම් පින්වත, දහමෙහි ස්වාක්ඛාත බව ඒකාන්තයෙන් ආශ්චර්යයෙකි. පින්වත ඒකාන්තයෙන් පුදුමයකි. ගෘහපතිය, මම මේ ශාසනයෙහි පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමි'' (සංයුක්ත නිකාය, අචේල සූත්‍රය 2005: 550).[4] ඒ විශ්මයම ඔහු පැවිද්දෙහි අලවන්නට සමත් විය.

සමාජය ගිහි පැවිදි වශයෙන් ද්විවිධ වේ. ගිහි සමාජය පඤ්චකාමසම්පත්තියෙහි ඇලී ගැලී කටයුතු කරද්දී පැවිදි සමාජය වෙර දරණුයේ එයින් විනිර්මුක්තව විමුක්තිය පසක් කරගැනීමට ය. ඒ විමුක්තියට මාර්ගය කුමක් දැයි අන්‍ය ශාස්තෘවරුන්ට හෝ ශ්‍රාවකයන්ට අවබෝධයක් නොවීය. එහෙත් බෞද්ධ සමාජයේ ස්වරූපය හාත්පසින්ම වෙනස් මගක් ගන්නා ලදී. අවබෝධාත්මකව ධර්මය ශ්‍රවණය කරන ලද බොහෝ දෙනා කල්පනා කරන ලද්දේ මෙසේ ය. ''බුදුන් වහන්සේ යම් යම් ආකාරයෙන් දහම් දෙසත් ද, ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්ත පරිපූර්ණ වූ ඒකාන්ත පරිශුද්ධ වූ මේ සංඛලිඛිත බ්‍රහ්මචාර්යය කරන්නට පහසු නොවේ. මම කෙස් රවුළු බහා කසාවත් හැඳ පොරවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වන්නෙමි නම් මැනවි'' (මජ්ඣිම නිකාය, රට්ඨපාල සූත්‍රය 2005: 420)[5] ගිහි ශ්‍රාවකයන් ලෙසින් ධර්මය ශ්‍රවණය කළ ද බෞද්ධ පැවිද්දෙහි පවත්නා සුවිශේෂ බව වටහා ගන්නට තරම් ශක්තිමත් අවබෝධයක් ඔවුන් සතු වීමෙන් ප්‍රකට වන්නේ බෞද්ධ පැවිද්ද ආධ්‍යාත්මික ගුණයන් සුවසේ වඩන්නට තෝතැන්නක් වූ බවයි.

පැවිද්ද වනාහි පහසුවෙන් ලැබිය හැක්කක් නොවේ. බුදුසමය තුළ, ගත පැවිදි කරනවා සේම සිත පැවිදි කිරීම ද අවධාරණය කරයි. ගත පැවිදි කිරීම පහසුවෙන් කළහැකි වුව ද සිත පහසුවෙන් පැවිදි කළ නොහැකි ය. එනිසා බුදුන් වහන්සේ ''සැක දුරු නොකළ සත්ත්වයා නිරිවස්ත්‍රව විසීමේ ව්‍රතයෝ පිරිසිදු නො කරති. ජටා දැරීම ද, මඩ ගා ගැනීම

ද, ආහාර නොගැනීම ද, බිම නිදා ගැනීම ද, ශරීරයෙහි දූවිලි කුණු දැරීම ද, උක්කුටිකව හිඳීම ද යන මේ කිසිම තපෝ ගුණයක් සැක දුරු නොකළ සත්ත්වයා පිරිසිදු නොකරයි. යම් පුද්ගලයෙක් ඇඳුම් පැළඳුම්වලින් සැරසුනේ වී නමුත් තිදොර හික්මවා ගෙන සමව හැසිරේ නම්, රාගාදියෙන් ශාන්ත නම්, ඉඳුරන් දමනය කළේ නම්, ගති නියත නම්, ලෞකික ලෝකෝත්තර ශ්‍රේෂ්ඨ හැසිරීම් ඇත්තේ නම්, සත්ත්ව හිංසා රහිත බැවින් සියලු සතුන් කෙරෙහි හිතානුකම්පීව බහා තැබූ දඬු ඇත්තේ නම්, බ්‍රාහ්මණ වනුයේත් ඔහුම ය. ශ්‍රමණ වනුයේත් ඔහුම ය. භික්ෂු වනුයේත් ඔහුම ය. (ඤාණරතන හිමි 1995: 81-82).[6] යන ධම්මපද දේශනයෙන් ඒ බව අවධාරණය වේ.

දිනක් ජම්බුඛාදක පරිබ්බාජකයා සැරියුත් හිමියන් වෙත පැමිණ ඇවැත්නි, මේ දහම තුළ කුමක් දුෂ්කර වේදැයි විමසූ කල්හි උන්වහන්සේගේ පිළිතුර වූයේ පැවිද්ද දුෂ්කර බවයි. එමෙන්ම පැවිද්දෙහි කුමක් දුෂ්කර දැයි විමසූ විට පැවිද්දෙහි ඇලීම දුෂ්කර බවත්, පැවිද්දෙහි ඇලුණහු හට කුමක් දුෂ්කර දැයි විමසූ විට ධර්මානුධර්ම ප්‍රතිපදාව දුෂ්කර බවත්, එසේ ධර්මානුධර්ම ප්‍රතිපදාවේ යෙදුණු කල්හි අර්හත්වය ප්‍රතිවේද කෙරේ දැයි විමසූ කල්හි එබඳු තැනැත්තා නොබෝ කලකින්ම අර්හත්වය ප්‍රතිවේද කරන බවත් ප්‍රකාශ කරන ලදී. (සංයුක්ත නිකාය, ජම්බුඛාදක සංයුක්තය දුක්කර සූත්‍රය 2005: 486).[7] පැවිද්ද අර්ථවත් වූවක් ලෙස සලකන ලද්දේ සිතේ ආධ්‍යාත්මික වශයෙන් ගොඩ නැගෙන ගුණාංගයන් මතය. වෙසෙසින්ම අනුපූර්ව ලෙසින් එය සිදුවන්නේ කවරාකාරයෙන්දැයි සාමඤ්ඤඵලය පිළිබඳ විමසූ අජාසත් රජුට බුදුන් වහන්සේ විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව බෞද්ධ පැවිද්දා විසින් බ්‍රහ්මචාරී දිවියට ප්‍රවේශ වීමත් සමග,

1. චතුපාරිශුද්ධ ශීලයෙන් යුතු වේ.
2. එළඹ සිටි සිහියෙන් යුක්ත වේ.
3. විවේකී සෙනසුන් ඇසුරු කෙරේ.
4. පඤ්ච නීවරණයන් දුරු කෙරේ.
5. ධ්‍යාන උපදවා ගනී.
6. ඤාණදස්සනය පිණිස සිත යොමු කෙරේ.
7. ඍද්ධිවිද ඥානය උපදවා ගැනේ.
8. දිබ්බසෝත ඥානය උපදවා ගැනේ.
9. පරචිත්තවිජානන ඥානය උපදවා ගැනේ.
10. පුබ්බේනිවාසානුස්සති ඥානය උපදවා ගැනේ.
11. චුතූපපාත ඥානය උපදවා ගැනේ.
12. ආසවක්ඛය ඥානය ප්‍රතිවේදයත් සමග අර්හත්ඵල සාක්ෂාත් කෙරේ

(දීඝ නිකාය, සාමඤ්ඤඵල සූත්‍රය 2005: 110-146).

මේ වනාහි ශ්‍රමණ ප්‍රතිපදාවයි. ශීලයෙන් අරඹන සිය පැවිදි දිවිය අර්හත්ඵල ප්‍රතිවේදය අවසන් කොට ඇති උත්තම ජීවිතයක් බවට පත්කොට ගැනීමට වීර්ය කෙරේ. එනිසා සාන්දෘෂ්ටික සාමඤ්ඤඵලයක් හිමි වීම බෞද්ධ පැවිද්දෙහි සුවිශේෂී ලක්ෂණය ලෙස හඳුනාගත හැකි ය.

එපමණක් නොව අන්‍ය සාමයික සංස්ථාවන්වලට වඩා ආචාර සමාචාරයන් පිළිබඳ දැඩි අවධානයක් යොමු කොට තිබීම ද සංඝ සංස්ථාවන්හි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි. භික්ෂුව ආචාර සමාචාරයන්ගෙන් හෙබි ආදර්ශමත් චරිතයක් ලෙසින් හැසිරෙනු දැක්ම සංඝ සමාජයේ සේම ගිහි සමාජයේ ද අරමුණ විය. එනිසා ග්‍රාම්‍යත්ත්වයට නොගැලපෙන ඇවතුම් ඇති කල්හි අභ්‍යන්තර හා බාහිර විවේචනයන් තුළින් ඒවා දුරුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග යන් නිරන්තරයෙන්ම ගැනීම බුදුන් වහන්සේ වෙතින් සිදුවිය. දිනක් බුදුන් වහන්සේ වෙත පැමිණි පහාරාධ නම් අසුරේන්ද්‍රයා භික්ෂූන් වහන්සේලා සසුනෙහි සිත් අලවා වාසය කරත් දැයි ඇසූ පැනයට පිළිතුරු දුන් බුදුන් වහන්සේ භික්ෂූන් සසුනෙහි සිත් අලවා වාසය කරන බව සඳහන් කරමින් සඟසසුනෙහි විද්‍යමාන ආශ්චර්යය ධර්ම 08ක් පෙන්වා දුන්හ. එනම්;

1. සසුනෙහි අනුපූර්ව ශික්ෂාවන්, ක්‍රියාත්මක වීමක්, ප්‍රතිපදාවක් වෙයි. ආදියෙහි ම අර්හත්ව ප්‍රතිවේදය නොවේ.
2. ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා ජීවිතය හේතුවෙනුදු පණවා වදාළ ශික්ෂාපදයක් ව්‍යතික්‍රමණය නො කරති.
3. ශාසනය තුළ යම් දුශ්ශීල භික්ෂුවක් වේ නම්, භික්ෂු සංඝයා ඔහු හා ඇසුරක් නො පවත්වයි. භික්ෂු සංඝයා ඔහු කෙරෙන් දුරස් වූයේ වෙයි.
4. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යන සිව් කුලයෙන් නික්ම පැවිදි වූවෝ කුල ගෝත්‍ර හැරපියා ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බවට පත්වෙති.
5. බොහෝ භික්ෂූන් වහන්සේලා අනුපාදිශේෂ පරිනිර්වාණයට පත්වූවාහු නමුදු නිර්වාණ ධාතුවෙහි අඩු බවක් හෝ පිරුණු බවක් නො පැනේ.
6. මෙම ධර්මවිනය එකම විමුක්ති රසය ඇත්තේ වේ.
7. මෙම ධර්මවිනයෙහි සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නම් වූ වටිනා රත්න ඇත්තේ වේ.
8. මේ ධර්මවිනයෙහි සතර ඵලයන්ට පත් වූ හා සතර ඵලයන්ට පත්වීමට පිළිවෙත් පුරණ භික්ෂූහු වෙති (අංගුත්තර නිකාය, පහාරාද සූත්‍රය 2005: 86-92).

සමූහයක් ලෙස එකම විමුක්තිය අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වූ බෞද්ධ පැවිද්ද හා ශාසනය ආශ්චර්යමත් ගුණයන්ගෙන් සෝභිත වූවක් බව ඉහත කරුණු 08 විමසීමේදී මැනවින් පසක් වේ.

බෞද්ධ පැවිද්දෙහි සුවිශේෂත්වය විමසීමේදී වැදගත් වන සූත්‍රයකි, පිණ්ඩෝල්‍ය සූත්‍රය. පැවිද්දෙහි අරමුණ කෙබඳු වූවක් දැයි බුදුන් වහන්සේ නවක පැවිද්දන් පිරිසක් විෂයෙහි පෙන්වා දී තිබේ. ''මහණෙනි, පිණ්ඩාහාරයෙන් ජීවත් වීම ජීවිකාවන් අතර අන්තිමට ගැනෙන්නකි. පාත්‍රයක් අතින් ගත් අතැතිව පිඬු පිණිස හැසිරීම යන මේ කරුණ ලෝකයේ විශේෂයෙන් ශාපයට ලක් වූවකි. එහෙත් සසුන් වන් කුල පුත්‍රයන් පිණ්ඩාහාරයෙන් යැපෙන්නේ හෙතුවක් ඇතිව ය. රජුන් විසින් ධනය පවරාගත් නිසා නොවේ. භයින් පෙළුනෙකු ලෙස ද නොවේ. ජීවිකාවට මගක් නැති නිසා ද නොවේ. සොරුන් විසින් පැහැරගත් ධනය ඇති නිසා ද නොවේ. ණයෙන් පෙළුන අයෙකු ලෙස ද නොවේ. භයෙන් පෙළුන අයෙකු ලෙස ද නොවේ. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක. පරිදේව, දුක් දොම්නස් උපායාස සහිත සසරට බැසගත් අයෙකු ලෙස ය. එයින් ලබන පීඩාවන්ගෙන් සමස්ත දුක් සමූහයෙන් මිදීමක් ඇත්නම් ඒ සඳහා ය'' (සංයුක්ත නිකාය, පිණ්ඩෝල්‍ය සූත්‍රය 2005: 158).[8] බුදුන් වහන්සේ විසින්ම පෙන්වා දී ඇති ආකාරයට බුදුසමය තුළ පැවිද්ද කෙසේ නම් අර්ථවත් කෙරේ දැයි ඉහත දේශනාව තුළින් ප්‍රකට වේ.

මජ්ඣිම නිකායේ ධම්මචේතිය සූත්‍රයේ දී කොසොල් මහරජු තෙරුවන් විෂයෙහි ප්‍රසාදයට පත්වනුයේ කවර කරුණු පදනම් කොට ගෙන දැයි බුදුන් වහන්සේට ප්‍රකාශ කරයි. එහිදි රජු විසින් අන්‍ය සාමයික ශ්‍රමණ සම්ප්‍රදායන් තුළ විද්‍යමාන නොවන බුදුසමයට ආවේණික වූ උත්තම ගුණාංග කිහිපයක් පෙන්වා දී තිබේ.

1. භික්ෂූන් දිවිහිමි කොට පිරිසිදු පිරිපුන් බ්‍රහ්මචර්යාව ආරක්ෂා කිරීම (ඉධ පනාහං භන්තෙ, භික්ඛු පස්සාමි යාවජීවං ආපාණකොටිකං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්තෙ, තං ඛො පනාහං භන්තෙ, ඉතො බහිද්ධා අඤ්ඤං එවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං න සමනුපස්සාමි)

2. භික්ෂූන් ඔවුනොවුන් හා වාදවිවාද නොකරමින් කිරි දිය සේ එක්ව ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වාසය කිරීම (ඉධ පනාහං භන්තෙ, භික්ඛූ පස්සාමි සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරෝදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති)

3. භික්ෂූන් තුටුපහටුව ඔදවැඩී ගිය සිත් ඇතිව අභිරත ඉඳුරන් ඇතිව පිනාගිය ඉඳුරන් ඇතිව ප්‍රත්‍යයෙහි ආයාසයෙන් තොරව නිර්භයව අනුන් දුන් දෙයින් යැපෙමින් ආශාවන්ගෙන් නොපෙලුන සිතින් වාසය කිරීම (ඉධ පනාහං භන්තෙ භික්ඛූ පස්සාමි හට්ඨපහට්ඨා උදග්ගුදග්ගා අභිරතරූපා පීණිතින්ද්‍රියා අප්පොසුක්කා පන්නලොමා පරදවුත්තා මිගභූතෙන චේතසා විහරන්ති)

4. භික්ෂූන් වහන්සේලා විසින් බුදුන් වහන්සේ සියගණන් පිරිසට දහම් දෙසද්දී අවම වශයෙන් කිවිසුම් හඬක් හෝ පිට නොකිරීම (ඉධ පනාහං භන්තෙ, භික්ඛූ පස්සාමි යස්මිං සමයෙ භගවා අනෙකසතාය පරිසාය ධම්මං දේසෙති, නෙව තස්මිං සමයෙ භගවතො සාවකානං ඛිපිතසද්දො වා හෝති උක්කාසිතසද්දො වා)

5. බුදුන් වහන්සේට වාදාරෝපණය කිරීම පිණිස පැමිණෙන්නවුන් බුදුන් වහන්සේගේ දහම් කථාවන් අසා ශ්‍රාවක සංඝයා බවට පත්වීම (තෙ භගවා ධම්මියා කථාය සන්දස්සෙති සමාදපෙති සමුත්තෙජෙසි සම්පහංසෙති, තෙ භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමුදපිතා සමුත්තේජිතා සම්පසංසිතා න චෙව භගවන්තං පඤ්හං පුච්ඡන්ති. කුතො වාදං ආරොපෙස්සන්ති. අඤ්ඤදත්ථු භගවතො සාවකා සම්පජ්ජන්ති) (මජ්ඣිම නිකාය, ධම්මචේතිය සූත්‍රය 2005: 550-560)

සමස්ත භික්ෂු සංඝයා වෙතින් ප්‍රකට වූ ශාස්තෘ ගෞරවය හා ධර්ම ගෞරවය ප්‍රමුඛ කරගත් චර්යා පද්ධතිය තත්කාලීන සමාජය තුළ ගෞරවනීයත්වයක් හිමිකරගැනීමට හේතු වූ බව පැහැදිලිය.

භික්ෂු සංඝයා සමූහයක් ලෙසින් කෙතරම් ශික්ෂණයකින් හෙබි වූයේ දැයි කියැවෙන තොරතුරු රාශියක් පෙළ දහම තුළ හමු වේ. බුදුන් වහන්සේ හමුවීමට රජගහනුවර අඹ වනයට ගිය අජාසත් රජු තැති ගැන්වීමට එම පරිසරය තුළ පැවති නිහඬතාවය හේතු විය. අවම වශයෙන් මහත් භික්ෂු පිරිසක් වැඩසිටි පරිසරයෙන් කිවිසුම් හඬක් හෝ ශ්‍රවණය නොවුණි. මෙකී චර්යාවන් මුළු මහත් සමාජයේම ගිහි පැවිදි භේදයකින් තොරව පැවැත්ම අපේක්ෂා කළ ආකාරය අජාසත් රජුගේ අපේක්ෂාවෙන් පැහැදිලි වේ. රජුගේ අපේක්ෂාව වූයේ උදායිභද්ද කුමාරය ද භික්ෂු සංඝයා සෙයින් සන්සුන් බවින් යුතුවනු දැකීමයි. (දීඝනිකාය, සාමඤ්ඤඵල සූත්‍රය 2005:88).[9] මුළු මහත් සමාජයටම පරමාදර්ශී සමාජයක් ලෙසින් සාදර්ශවත්ව පෙනී සිටීම ද භික්ෂු සංස්ථාවෙහි සුවිශේෂී ලක්ෂණයයි.

මෙම සංඝශෝභන ගුණයන් සිත්ගත්තේ, ඇගයීමට ලක්වූයේ ගිහි සමාජය තුළ පමණක් නොවේ. අන්‍ය සාමයික පැවිද්දන්ගේ ද ඇගයීමට ලක් විය. කන්දරක පරිබ්බාජකයාගේ ප්‍රකාශයෙන් ඒ බව සනාථ වේ. ''එකත් පසෙක සිටියා වූ කන්දරක පරිබ්‍රාජකයා නිහඬව වැඩහුන් භික්ෂු සංඝයා දෙස බලා බුදුන් වහන්සේට මෙසේ කීවේය. ආශ්චර්යයෙකි. භවත් ගෞතමයෙනි, අද්භූත ය භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයන් වහන්සේ විසින් භික්ෂු සංඝයා මැනවින් ප්‍රතිපාදනය කරන ලදී'' (මජ්ඣිම නිකාය, කන්දරක සූත්‍රය 2005: 02)[10] පෙළ දහමෙහි හමුවන මෙවැනි තොරතුරු විමසා බැලීමේදී භික්ෂු සංස්ථාව සාකල්ල්‍යයෙන් ම අන් ශ්‍රමණ සම්ප්‍රදායන් අතර සුවිශේෂී සංස්ථාවක් වූ බව හඳුනාගත හැකි ය. එම නිසා විමුක්තිය පරමාභිලාශය කොටැති බෞද්ධ පැවිද්ද වනාහි සුවිශේෂී වූවක් බව සඳහන් කළ යුතු ය.

## නිගමනය

බුද්ධකාලීන සමාජය තුළ ''ජටිල, අචේලක, නිගණ්ඨ, ඒකසාටක, ආජීවක'' ආදි විවිධ ශ්‍රමණ කණ්ඩායම් විය. බෞද්ධ භික්ෂුව ද හඳුන්වන ලද්දේ ''ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ'' යනුවෙනි. ඒ නිසා බ්‍රාහ්මණ ආගමික සංකල්ප පසෙක ලා ගිහිගෙයින් නික්ම ආගමික චර්යාවකට එළඹි පුද්ගලයා පොදුවේ ශ්‍රමණ නාමයෙන් හඳුන්වා ඇත. එබඳු පුද්ගලයන් වෙතින් ''අනගාරික බව, සංචාරක ජීවිතයක් ගත කිරීම, නිත්‍ය වාසස්ථාන නොමැති බව, භික්ෂාවෙන් යැපීම, වර්ෂා ඍතුවේ පමණක් එක් තැනක වාසය කිරීම, තැනින් තැන ගොස් සිය ධර්මය ප්‍රචාරය කිරීම, ඊශ්වර නිර්මාණවාදය බැහැර කිරීම'' යනාදි ලක්ෂණ ප්‍රකට විය.

බෞද්ධ භික්ෂුව වෙතින් ද මෙකී ආකෘතිකමය ලක්ෂණ ඒ අයුරින්ම විද්‍යමාන වේ. එහෙත් සෙසු ශ්‍රමණ සම්ප්‍රදායන් කෙරෙන් විද්‍යමාන නොවූ ගුණාංග රාශියක් භික්ෂූන් වහන්සේලා වෙතින් විද්‍යමාන වූ අතර එනිසාම තත්කාලීන සමස්ත සබුද්ධික ජනයා අතර බුදුසසුනට ඉහළ පිළිගැනීමක් හිමි වූ බව ත්‍රිපිටකාගත කරුණු තුළින් අනාවරණය කරගත හැකි ය. ඒ අනුව ''දුක්ඛ නිස්සරණය පදනම් කොටගෙන සිය ආගමික චර්යාව අනුගමනය කිරීම, ශාස්තෘ ගෞරවය, ධර්ම ගෞරවය, ප්‍රියශීලී බව, ධ්‍යාන ඵල සමාපත්තීන්ට නැඹුරු වූ බව, සමඟි සම්පන්න බව, සතර මාර්ගඵලයන්ට පත් වූ හෝ පත්වීමට වෙර දරණ බව'' යනාදි සුවිශේෂ ගුණාංග රාශියක් භික්ෂුව සතු වූ බව පෙනේ. එසේම බෞද්ධ පැවිද්ද ''මනාව දුකෙන් එතෙරවීම සඳහාම වූ ශාසන බ්‍රහ්මචර්යාවක් විය'' මේ හේතුන් නිසා බෞද්ධ පැවිද්ද හා සඟසසුන තත්කාලීන ශ්‍රමණ සම්ප්‍රදාය අතුරෙහි සුවිශේෂී ස්ථානයක් හිමිකොටගත් බව නිගමනය කළ හැකි ය.

## (Endnotes)

1 ''සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි.''

2 ''ඉධෙව භික්ඛවෙ පඨමො සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො, සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙති, එව මෙවං භික්ඛවෙ සම්මා සීහනාදං නදථ.''

3 ''සො අපරෙන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජේසු භය දස්සාවි. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.''

4 ''අථ ඛො ආයස්මා අඤ්ඤාකොණ්ඩඤ්ඤො දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තෝ අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච. 'ලභෙය්‍යා' හං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති' එහි භික්ඛූ' ති භගවා ආවොච. 'ස්වාක්ඛාතො ධම්මො චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියායා' ති.''

5 ''ඉමෙහි ඛො ගහපති තිංසමත්තෙහි වස්සෙහි නත්ථි කොචි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො, අඤ්ඤත්‍ර නග්ගෙය්‍යා ච මුණ්ඩෙය්‍යා ච පවාළනිප්ඵොටනාය චාති.''

6 ''අච්ඡරියං වත භො අබ්භුතං වත භො ධම්මස්ස ස්වාක්ඛාතා යත්‍ර හි නාම ගිහී ඔදාතවසනා එවරූපං උත්තරිමනුස්සධම්මං අලමරියඤාණදස්සනවිසෙසං අධිගමිස්සන්ති ඵාසුවිහාරං, ලභෙය්‍යාහං ගහපති ඉමස්මිං ධම්මවිනයෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.''

7 ''යථා යථා බො භගවා ධම්මං දෙසෙති. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසාවානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.''

8 න නග්ගචරියා න ජටා න පඞ්කා - නා නාසකා ථණ්ඩිලසායිකා වා
රාජො ච ජල්ලං උක්කුටිකප්පධානං - සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං
අලඞ්කතො චෙපි සමංචරෙය්‍ය - සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරි
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං - සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු

9 ''කින්නු බො ආවුසො සාරිපුත්ත ඉමස්මිං ධම්මවිනයෙ දුක්කරන්ති. පබ්බජ්ජා බො ආවුසො ඉමස්මිං ධම්මවිනයෙ දුක්කරාති. පබ්බජිතෙන පනාවුසො කිං දුක්කරන්ති. පබ්බජිතෙන බො ආවුසො අභිරති දුක්කරාති. අභිරතෙන පන ආවුසො කිං දුක්කරන්ති. අභිරතෙන කො ආවුසො ධම්මානුධම්ම පටිපත්ති දුක්ඛරාති. කීව චිරං පනාවුසො ධම්මානුධම්මපටිපන්නො භික්ඛු අරහං අස්සාති න චිරං ආවුසොති.''

10 ''අත්තමිදං භික්ඛවෙ, ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං. අභිසාපොයං ලොකස්මිං පිණ්ඩොලො විචරසි පත්තපාණී'ති තං ච බො එවං භික්ඛවෙ, කුලපුත්තා උපෙන්ති අත්ථවසිකා අත්ථවසං පටිච්ච, නෙව රාජාභිනීතා න චොරාභිනීතා න ඉණට්ටා න භයට්ටා න ආජීවිකාපකතා. අපි ච බො ඔතිණ්ණම්හා ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි දුක්ඛොතිණ්ණා දුක්ඛපරෙතා අප්පෙවනාම ඉමස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති.''

11 ''ඉමිනා උපසමෙන උදායිභද්දො කුමාරො සමන්නාගතො හොතු යෙනෙතරහි උපසමෙහි භික්ඛුසංඝො සමන්නාගතො.''

12 ''ඒකමන්තං ඨිතො බො කන්දරකො පරිබ්බාජකො තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසංඝං අනුවිලොකෙත්වා භගවන්තං ඒතදවෝච. අච්ඡරියං භො ගොතම. අබ්භූතං භො ගොතම. යාවඤ්චිදං හොතා ගොතමෙන සම්මා භික්ඛුසංඝො පටිපාදිතො.''

## පරිශීලිත ග්‍රන්ථ


අංගුත්තර නිකාය (2005). දෙහිවල : බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දීඝ නිකාය (2005). දෙහිවල : බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධම්මපදට්ඨකථා (1908). කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය.

පරමත්ථදීපනී නාම උදානට්ඨකථා (1929). කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය.

මජ්ඣිම නිකාය (2005). දෙහිවල: බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සංයුක්ත නිකාය (2005). දෙහිවල: බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සද්ධම්මපකාසිනී නාම පටිසම්භිදාමග්ගට්ඨකථා (1965). කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය.

අරියවිමල හිමි, කොස්වත්තේ (1996). උසස් පෙළ බුද්ධධර්මය, සමයවර්ධන මුද්‍රණාලය.

ඤාණරතන හිමි, වැලිගම (1995). සිංහලානුවාද සහිත ධම්මපදය, මහනුවර බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.

රාහුල හිමි, අත්තුඩාවේ, ඤාණප්පිය හිමි පාතේගම, විමලඤාණ හිමි, නාඹටුන්නේ (1998). උසස් පෙළ බුද්ධධර්මය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Rhys Davids, T. W. Stede, William, (2004). Pali – English Asian Education services, New Delhi.

Edgerton, Frankling (1993). Buddhist Hybrid Sanskrit Grammar and Dictionary, New Haven.